Speech by Prof Sampath Amaratunge, Vice Chancellor of University of Sri Jayewardenepura at Vidyodaya Literary Awards- විද්‍යෝදය සාහිත්‍ය මහෝත්සවය 2015 on 22nd September 2015 at Sumangala Reading Room of University of Sri Jayewardenepura

**සංසාරය නමැති විෂ වෘක්ෂයෙහි අමරණීය ඵල දෙකක් හට ගනියි. ඒ යහපත් භාෂිතයන්ගේ රසය ආස්වාදනය කිරීම සහ සජ්ජනයන් ඇසුරු කිරීම යි.**

අපි අද සූදානම් වනුයේ මේ කාරණා දෙක අඩු වැඩි වශයෙන් භුක්ති විඳින්න යි.

**විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදානය**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය මට මතක හැටියට අවුරුදු දහයක් තිස්සේ මේ කාර්යයට උරදීලා තියෙනවා. මේ සාහිත්‍ය උත්සවය පවත්වන්නෙත් දහවන වරට වෙන්න ඕන. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතුරින් සාහිත්‍ය උත්සවයක් පවත්වන එක ම විශ්වවිද්‍යාලය තමයි අපේ විශ්වවිද්‍යාලය. ඒක අපට මහත් අභිමානයට හේතුවක් බව අමුතුවෙන් කියන්න උවමනා නැහැ.

මා දන්නා තරමින් අභාවප්‍රාප්තතිස්ස කාරියවසම් සම්මානිත මහාචාර්යතුමන්ගේ අදහසක් අනුව ආරම්භ කරන ලද මේ කාර්යය සේවාර්ජිත මහාචාර්ය සුනිල් ආරියරත්නයන් විසින් විශ්‍රාම යන තෙක් ඉදිරියට අරගෙන ආ බව රහසක් නෙමෙයි. විද්‍යෝදය සම්මාන උළෙල ආරම්භ කළ දා පටන් සාහිත්‍ය මාසයේ පළමු සාහිත්‍ය උළෙල ලෙස කීර්තිමත් ආකාරයෙන් සංවිධානය කරන්න එතුමා උත්සාහ ගත් ආකාරය අපට අමතක කරන්න බැහැ.

මම අහලා තිබෙන හැටියට කිසියම් අර්ථවත්, රසවත් දෙයක් සහිත භාවයෙන් යුතු දෙයට තමයි සාහිත්‍යය කියලා කියන්නෙ. මේ අවබෝධය අපට ලැබෙන්නේ අපේ නිර්මාතෘවරුන්ගෙන්. මේ විශ්වවිද්‍යාලය අපට දායාද කොට දෙන ලද හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේත් වැලිවිටියේ ශ්‍රී සෝරත ස්වාමිපාදයන් වහන්සේත් යන දෙදෙනා ම තාක්ෂණ පහසුකම් අද වගේ නොතිබුණු කාලයක ඒ අර්ථසම්පන්න සහිතභාවයෙන් යුක්ත දේවල් ලෝකයට දීපු මහා සාහිත්‍යධරයන් දෙදෙනෙක්. උන්වහන්සේලාගේ ඒ සම්ප්‍රදාය ඉදිරියට ගෙන යන්න තමයි මෙවැනි දේවල්

සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය සංවිධානය කරන්නේ. එය සාහිත්‍යයට රුචිකරන අප සැමගේ ම මහත් අමන්දානන්දයට හේතුවක්.

අපි එදා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය පිළිබඳ ව දැනගත්තේ සිංහල අධ්‍යයනාංශයේ හිටපු කීර්තිමත් මහාචාර්යවරුන්, ආචාර්යවරුන් නිස යි. මහාචාර්ය කාන්ගහආරච්චි, මහාචාර්ය විමල විජයසූරිය, ආචාර්ය උදය මල්ලවආරච්චි, මහාචාර්ය ගතාරේ ධම්මපාල ස්වාමීන් වහන්සේ වගේ විද්වත්තු අද අප අතර නැති වුණත් අපේ මතකයේ ජීවත් වෙනවා. ඒ අතර මෑත කාලයේ හදිසියේ ම අප අතරින් වියෝ වුණු සාහිත්‍යය ජීවිතය කරගත් මහාචාර්ය ඒ වී සුරවීර සහ මහාචාර්ය කාරියවසම් යන චරිතත් අපට මේ මොහොතේත් සිහිපත් වෙනවා.

විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සමාරම්භයේ පටන් අද දක්වාත් අප විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යාපීඨයෙහි කටයුතුවලට සිය උපරිම ශක්ති ප්‍රමාණයෙන් නොපැකිල දායකත්වය සපයමින් ශාස්ත්‍ර ගවේශනයෙහි ද යෙදෙන මහාචාර්ය බලගල්ලේ විද්වතා අපට කෙතරම් ආශීර්වාදයක් ද?

සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය විද්‍යෝදය සාහිත්‍ය සම්මාන ප්‍රදාන සඳහා මෙවර නව අංග දෙකක් එකතු කරගෙන තිබෙන බව පේනවා. විශිෂ්ටතම ශාස්ත්‍රීය කෘතිය තෝරා ගැනීම එයින් ඉතා හොඳ ප්‍රවණතාවක්. ඒ වගේ ම සාහිත්‍යය වෙනුවෙන් විශිෂ්ට සේවයක් කරන ලද විද්වතකු අගයන එකත් කළ ගුණ සැලකීමේ, ප්‍රණාමය පළ කිරීමේ හොඳ අවස්ථාවක්.

එහෙත් තීරු ලිපි සහ ගීත සාහිත්‍ය කෘති සඳහා වන අවස්ථාව විද්‍යෝදය සම්මාන ප්‍රදානයෙන් සංවිධායකයන් විසින් අහක් කරලා තියෙනවා. උපකුලපතිවරයා හැටියට නොවෙයි මා සාමාන්‍ය රසිකයකු හැටියට වඩාත් කැමැති වන්නේ තීරු ලිපි සංග්‍රහයටත් තෑග්ගක් දුන්නා නම් තමයි.

මොකද සිංහල සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය මාධ්‍යවේදීන් රාශියකට ලේඛකත්ව පාඨමාලාව ඔස්සේ පාඨමාලා දෙකක් හඳුන්වා දෙන අධ්‍යයනාංශයක් නිසා. යහපත් මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම උදෙසා එයින් ලොකු දිරිගැන්වීමක් වුණාය කියන විශ්වාසය මට තිබෙනවා. උදාහරණයක් හැටියට විද්‍යෝදය සම්මානලාභී විශිෂ්ට තීරු ලිපි

රචකයෙකු වන විමලනාත් වීරරත්න රාවයෙන් අස්වුණාය කියන කාරණය ''නිව්ස්'' එකක් වෙන්නේ ඒ නිසාය කියලයි මගේ නම් හැඟීම.

ඒ වාගේම තමයි ගීත සාහිත්‍යයට පිරිනමන ලද සම්මානය ඉවත් කිරීමත්. එදා අපි හොඳින් අසා පුරුදු ජනසාහිත්‍යයෙහිත් ගීතමය ස්වරූපයක් තිබුණා. ඒවා පසුකාලීන විශිෂ්ට ගණයේ ගීත බවට පත්වුණා. එයිනුත් පසුව ඒවා සාහිත්‍ය කෘති බවට පත් වෙනවා.

**මහගමසේකරයන්ගේ ඈත කඳුකර හිමව් අරණේ, මහාචාර්ය ආරියරත්නයන්ගේ වහින්නට හැකිනම් ගිගුම් දී** වැනි ගී ඇහෙන කොට ඇතිවන හැඟීම වෙනස් එකක්.

අද අපට ඇසෙන කසිකබල් ගීත තව කාලයක් ගිහිං සාහිත්‍ය කෘති බවට පත්වෙලා මුද්‍රණද්වාරයෙන් එළියට ඒවී.

එතකොට විශිෂ්ට සාහිත්‍ය කෘතිය කියලා අද දවසේ යම් ගීත සාහිත්‍යයක් ඇගයීමකට ලක් වුවහොත් ඒවා අනාගත ආයෝජන බවට පත්වෙලා තියේවි.

මා මේ අදහස ප්‍රකාශ කෙළේ රසිකයකුගේ හැඟීමකින් මිස උපකුලපතිවරයා වශයෙන් කිසිදු බලපෑමක් සංවිධායක මණ්ඩලය වෙත කිරීමට නොවන බව එක හෙළාම කියන්න කැමතියි.

අවසාන වශයෙන් මෙවැනි භාරදූර කර්තව්‍යයකට උරදීම සම්බන්ධයෙන් වත්මන් අංශ ප්‍රධානතුමා මහාචාර්ය රත්නසිරි අරංගල මහතාටත් ඔහුගේ සහායකයන් සැමටත් උපකුලපතිවරයා වශයෙන් මගෙ ස්තුතිය පළ කරන්න කැමතියි.

මහාචාර්ය සම්පත් අමරතුංග
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයයේ උපකුලපති